# ශ්‍රී ලාංකේය අතීත සමාජයේ ගවයාට හිමි වූ තත්ත්වය පිළිබඳ අභිලේඛන මූලාශ්‍රමය විමසුමක්

**සේනානායක එස්.ආර්.එල්.[1]**

ලංකාවේ ජීවත් වූ අර්ධ සංචාරක එඬේර ජනයා කිරි ආහාර හා මාංශ සඳහා ගවයින් හීලෑකර ඇත. එමෙන්ම කාලයත් සමඟ ගෘහාශ්‍රිතව කෘෂි කටයුතු සඳහා මෙන්ම ප්‍රවාහන මාධ්‍යක් වශයෙන් ගවයා යොදාගන්නට ඇතැයි සැලකේ. ඒ හා සමකාලීනව සමාජීය හා ආර්ථික වශයෙන් ගවයාට හිමි වූ තත්ත්වය පිළිබඳ අභිලේඛන මූලාශ්‍රමය කරුණු මඟින් විමර්ශනය කිරීම පර්යේෂණයේ අරමුණු වේ. ඒ අනුව ලාංකීය සමාජයේ ගවයාට තිබූ සමාජීය පිළිගැනීම කෙබඳු ද? යන්න පර්යේෂණ ගැටළුව වේ. මෙහිදී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් පුස්තකාල අධ්‍යයනය සිදුකෙරිණි. සමකාලීන සෙල්ලිපි සාධක වලට අනුව ගවයා වෙළඳ භාණ්ඩයක් ලෙස භාවිත නොකරන ලෙසටත්, ගවයෙක් මැරුවොත් හෝ සොරකම් කළහොත් දැඩි දඬුවම් පැමිණ වූ බවත් වේවැල්කැටිය පුවරු ලිපිය සාධක සපයයි. එහි ''මීවුන් ගෙරි ගොන් එළුවන් මැරූවන් මරා පට්වනු කොට් ඉසා'' ලෙස සඳහන් කිරීමෙන් පෙනියන්නේ රාජ්‍ය පාලකයා විසින් නෛතික ලේඛනයක් මඟින් ගවයා සුරක්ෂා කිරීමට අනුග්‍රහ දැක්වූ ආකාරයයි. ලීලාවති රැජිනගේ පුලියම්කුලම් පුවරු ලිපියට අනුව දිළින්දන් සඳහා දන්හළක් කරවා ඒ සදහා "එළ සරක් මී සරකින් යෙළසික්" යනුවෙන් සඳහන් එළ මී හරකුන් 150ක් පරිත්‍යාග කොට එය මතුවටත් පැවත්විය යුතු යැයි දන්වා ඇත. එමගින් පරිත්‍යාගයන් සඳහා ගවයන් යොදාගැනිම තුළ සමකාලීනව සමාජයේ වටිනාකමක් නිරූපණය කොට ඇත. එමෙන්ම සමකාලීනව පිහිටුවා ඇති මොරගොඩ, ඇල්ලෙවැව, රඹෑව වැනි අත්තානි කණු කිහිපයකම විහාරාරාමවලට හා ගම්වලට ''ගැල් මීවුන්, ගම්ගොන්,  කිරිගෙරි, මීවුන්'' ඇතුළු කර නොගත යුතු බව දක්වා ඇත. එමගින් පෙනියන්නේ ආගමික කටයුතු සිදුකරන ස්ථාන සඳහා ගවයන් ඇතුලු කිරීමෙන් ඒවායේ කටයුතු සඳහා බාධා ඇති වීමයි. තවද ඊරිපින්නියෑව ලිපියේ සඳහන් "දී හිකිරි තෙල් නොගන්නා කොට් ඉසා" යනු සමකාලීනව ගවයාගෙන් පස්ගෝ රස ගෙන ඇති බව හා සමාජයේ එය ආහාර අතරින් අග්‍ර කොටක් ලෙස පරිභෝජනය කිරීම එකල කළ බවක් පෙන්වා දිය හැකිය. තවද "ගැල් මීවුන්" ලෙස සඳහන් කර ඇත්තේ එකළ ගැල් ඇදීමට යොදාගන්නා මී හරකුන් වේ. එමගින් සමකාලීනව පැවති ප්‍රධානතම ප්‍රවාහන මාධ්‍ය සඳහා යොදාගෙන ඇත්තේ ගවයා බව සනාථ වේ. ඇටවිරගොල්ලෑව සෙල්ලිපියෙන් නියෝග කර ඇත්තේ ගමේ ගවදෙනුන්, එළහරකුන්, ගැල් ගොනුන් වෙනත් ක්‍රියාවන් සඳහා නොගත යුතු බවයි. ඒ තුළින් දැකිය හැක්කේ සමකාලීනව ගවයා සේවයට යොදාගැනීමට නම් බදු ගෙවිමක් කළ යුතු බවත් අනවසරයෙන් ගවයන් රැගෙන නොයා යුතු බවත්ය. මේ ආකාරයට අභිලේඛන මූලාශ්‍රය මඟින් හෙළිවන අන්දමට මිනිසා විසින් හීලෑ කරගත් සතුන් අතර ගවයාට ආර්ථික වශයෙන් මෙන්ම සමාජීය වශයෙන් යම් පිළිගැනීමක් හිමිව තිබෙන බව මනාව පැහැදිලි වේ.

**ප්‍රමුඛ පද :** අභිලේඛන, මූලාශ්‍ර,ගවයා, සමකාලීන, සමාජීය

---

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, රජරට විශ්වවිද්‍යාලය. randisenanayaka09@gmail.com